# වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

# පුරප්පාඩු

**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ (සතොස)**
**පහත සඳහන් පුරප්පාඩු (කොන්ත්‍රාත්) තනතුරු සඳහා**
**ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. තාක්ෂණික නිලධාරී - (ප්‍රධාන කාර්යාලය සඳහා)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය - කොන්ත්‍රාත් / වසරක කාලයක් සඳහා**

**වැටුප -රු.65,633 + 17800* = 83,433**

**සුදුසුකම්**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට (NVQ 7) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**හෝ**

අදාළ තනතුරට සම්බන්ධ ක්ෂේත්‍රයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් (HNDE) හෝ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් (NDT) ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට (NVQ 6) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද ලබා තිබීම.

## 02. රියදුරු - පුරප්පාඩු 03 (ප්‍රධාන කාර්යාලය සඳහා)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය - කොන්ත්‍රාත් / වසරක කාලයක් සඳහා**

**වැටුප -රු. 40,834 + 17800* = 58,634**

**සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් උපරිම අවස්ථා දෙකකදී අවම වශයෙන් සම්මාන 02ක් සමඟ විෂයයන් 06ක් සමත්ව තිබීම සහ බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රය සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03ක රිය පැදවීමේ පළපුරුද්ද ලබා තිබීම.

***2024.01.12 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව**

ඉහත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් 2026.08.31 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුරු නාමය දැක්විය යුතුය.

**සභාපති,**
**සමුපකාර තොග වෙළඳ සංස්ථාව,**
**27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED